SEDR
Supporting Effective Dispute Resolution
ඵලදායීව ආරවුල් නිරාකරණයට සහායවීම
பயனுறுதிமிக்கவகையில் பிணக்கை தீர்ப்பதற்கு ஆதரவளித்தல்

# Supporting Effective Dispute Resolution

# Your document title

<u>ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය:</u>

*"සාධාරණ විකල්පයක් ශක්තිමත් කිරීම - SEDR වෙතින් පාඩම් සහ ගැඹුරු දැනුම"*

## 1. <u>සැසිවාරයේ මාතෘකාව</u>

තේමාත්මක සැසිවාර අංක 1

*අනාගතය සඳහා - සූදානම් වීමේ මැදිහත්වීම: ඵලදායී සමථකාරවරයෙකුගේ කුසලතාවන් සහ විශේෂඥතාවන් ශක්තිමත් කිරීම.*

## 2. <u>දිනය, වේලාව සහ ස්ථානය</u>

2025 අප්‍රේල් 29
09:45 – 11:00
ස්ථානය: ඕක් කාමරය

## 3. <u>සංකල්පයේ සාරාංශය / හැඳින්වීම</u>

ශ්‍රී ලංකාවේ ජාතික සමථකරණ වැඩසටහන තිරසාරව පවතින බව සහතික කිරීම සඳහා ද වර්ධනය වෙමින් පවතින ආරවුල් විසඳීමේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන බව සහතික කිරීම සඳහා ද ඵලදායී ධාරිතා වර්ධන ක්‍රියාවලිය සහ අන්තර් ඉගෙනීම අත්‍යවශ්‍ය වේ. සමථකාරවරුන්ගේ නිපුණතා හැඩගැස්වීමේදී ද වැඩසටහනේ සමස්ත ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය කරා මෙහෙයවීමේදී ද කේන්ද්‍රීය කාර්යභාරයක්

Part of the programme
STRIDE Strengthening Transformation, Reconciliation and Inclusive Democratic Engagement
Funded by the European Union
Implemented by
BRITISH COUNCIL
The Asia Foundation

ඉටු කරන සමථ පුහුණු නිලධාරීන් අතර හිමිකාරිත්වය පිළිබඳ හැඟීමක් ඇති කිරීම මෙම ක්‍රියාවලියේ ප්‍රධාන අංගයක් වනු ඇත.

මෙම සැසිවාරය මැදිහත්වීමේ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා ගෙන ඇති විවිධ ධාරිතා ගොඩනැගීමේ මුලපිරීම් පිළිබඳ වූ ගැඹුරු දැනුම බෙදා ගැනීමට සමථ පුහුණු නිලධාරීන්ට අඩිතාලමක් සපයනු ඇත. ඔවුන් පහත සඳහන් දෑ සාකච්ඡා කරනු ඇත:

- **උසස් මට්ටමේ පුහුණුව** - සමකාලීන සමථ පරිචයන් සමඟ සමථකාරවරුන්ගේ කුසලතාවන් ඉහළ නැංවීම.
- **විශේෂිත පුහුණුව** - ප්‍රජාවන් හරහා විවිධත්වයට සංවේදීතාව සහතික කරමින් සංකීර්ණ ආරවුල් හැසිරවීම සඳහා අවශ්‍ය සමථකාරවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම.
- **සංයුක්ත අඛණ්ඩ පුහුණුව** - දැනුම ව්‍යාප්ත කිරීම මඟින් පුහුණු ප්‍රවේශය පුළුල් කිරීම.
- **ඊකියාවන්වල යෙදීමේ උපදේශනය ලබාදීම** - අඛණ්ඩ ඉගෙනීම සහ වැඩිදියුණු කිරීම යනාදිය සහතික කිරීම.
- **රට තුළ හුවමාරු සංචාර** - විවිධාකාර සමථ කිරීමේ අත්දැකීම් වලින් ඉගෙනුම් ලැබීම.
- **ප්‍රජා සමථකරණ භාවිතාවන්** - එකිනෙකා සමග ඉගෙනීමට සහ සහයෝගීතාවයෙන් කටයුතු කිරීමට පහසුකම් සැලසීම.
- **සමථකරණ පර්යේෂණ සංසදය** - සමථකරණ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ උපයෝගී කර ගැනීම.

සමථ කිරීමේ වැඩසටහන පවත්වා ගෙන යන සහ වැඩිදියුණු කරන යාන්ත්‍රණයන් පිළිබඳව සහභාගිවන්නන්ට ගැඹුරු දැනුමක් ලැබෙනු ඇත. පුහුණු ක්‍රමවේද තවදුරටත් වැඩිදියුණු කරන්නේ කෙසේද සහ දිගුකාලීන බලපෑම ඇති කිරීම සඳහා අවශ්‍ය යහ පරිචයන් ආයතනිකකරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳ සංවාදය දිරිමත් කිරීම ද මෙම සැසිවාරයේ අරමුණක් වනු ඇත.

## 4. <u>සැසිවාරයේ පරමාර්ථ</u>

- ශ්‍රී ලංකාවේ වර්ධනය වෙමින් පවතින පසුබිමට ගැලපෙන පරිදි සමථ කිරීමේ වැඩසටහන් තිරසාරව පවත්වා ගෙන යාම සහ වැඩිදියුණු කිරීම යනාදිය සහතික කිරීම සඳහා සමථකාරකරුවන්ගේ දැනුම සහ කුසලතා යාවත්කාලීන කිරීමට අවශ්‍ය ධාරිතා වර්ධනය සඳහා ආයෝජනය කිරීමේ වැදගත්කම ඉස්මතු කිරීම.
- සමථ කිරීමේ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා ගෙන ඇති විවිධකාර ධාරිතා ගොඩනැගීමේ මුලපිරීම් කටයුතු පිළිබඳ ගැඹුරු දැනුම බෙදා ගැනීම පිණිස ධාරිතා ගොඩනැගීමේ මුලපිරීම්වල ප්‍රධාන ධාවකයන් වන සමථ පුහුණු නිලධාරීන්ට අඩිතාලමක් සපයා දීම.
- SEDR ව්‍යාපෘතිය හරහා ධාරිතා ගොඩනැඟීම සමඟ සමථ කිරීමේ වැඩසටහන වැඩිදියුණු කිරීමට TAF විසින් කිරීමට හැකි වූ දේ ප්‍රදර්ශනය කිරීම.

## 5. <u>මධ්‍යස්ථකරු / පහසුකම් සපයන්නා</u>

- මධ්‍යස්ථකරු: චන්ද්‍රල කුඹුකගේ මහත්මිය, වැඩසටහන් කළමනාකාරිනී, ආසියා පදනම.

## 6. <u>කථිකයන් / විශේෂඥ කණ්ඩායමේ සාමාජිකයන්</u>

- කථිකයා: ජොහාන් රීබට් මහතා, රට නියෝජිත, ආසියා පදනම
- ඉදිරිපත් කරන්නා: ජිනේන්ද්‍ර කොතලාවල මහතා, ස්වාධීන උපදේශක
- ඉදිරිපත් කරන්නා: ජොනතන් බාර්ට්ච් මහතා, CDR සහකරුවන් (වීඩියෝ සබැඳිය හරහා)
- ඉදිරිපත් කරන්නා: තිළිණි රත්නසූරිය මහත්මිය, ලේකම්, සමථ මණ්ඩල කොමිෂන් සභාව